සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 03 යි. විනාඩි 10 යි.

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

❖ අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

(01) නගරාධිපතිතුමාගේ උත්සාහය හා කැපවීම නිසා නගරයට **නව එළියක්** ලැබුණු බව ජනතාව පැවසූහ.
(1) මහත් ආලෝකයක් (2) අලුත් උනන්දුවක් (3) අලුත් දියුණුවක් (4) දැඩි පිළිගැනීමක්

(02) ඔවුන්ගේ නිවස වෙත ගිය ඇ **කිඹුල් කඳුළු හෙළමින්** කතා කළා ය.
(1) බොරු කනගාටුවක් පෙන්වමින් (2) මුළා කරමින්
(3) කිඹුලකු මෙන් කඳුළු හෙළමින් (4) ඇත්ත වසන් කරමින්

(03) පෞද්ගලික ජීවිතයේ තිබූ කරදර නිසා ඔහු රැකියාවට **ආයුබෝවන් කී** බව ජනනාථ කීවේ ය.
(1) සුබ පැතූ බව (2) කැපවී කටයුතු කළ බව
(3) දිගු කල් කළ හැකි වේවා! යන බව (4) සමුදුන් බව

❖ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) .................................................. කලාවක් වන ගීතය අසා රස විඳිය යුත්තකි.
(1) මනස්කාන්ත (2) ජනකාන්ත (3) අයස්කාන්ත (4) ඒකාන්ත

(05) ආතර් සී ක්ලාක් මහතා විද්‍යාත්මක ........................................ සිදු කරමින් සමාජය උදෙසා සුවිසල් මෙහෙවරක් ඉටු කළ යුග පුරුෂයෙකි.
(1) සමීක්ෂණ (2) නිරීක්ෂණ (3) ගවේෂණ (4) විමර්ශන

(06) සවන් දීම ළමා අප විසින් පුහුණු කර ගත යුතු අගනා ..................................................................
(1) ධර්මතාවයකි. (2) ගුණාංගයකි. (3) අත්දැකීමකි. (4) කුසලතාවයකි.

(07) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ලේඛනය, ක්ෂේත්‍රය, විශිෂ්ට, සන්තුෂ්ටිය
(2) නෂ්ටාවශේෂ, පරිච්ඡේදය, පැළ දිග, ප්‍රස්තාව පිරුළු
(3) ශ්‍රේෂ්ඨ, පිළිඹිබු, ප්‍රතිඵල, පරිශීලනය
(4) ආශ්වාදය, නිශ්චිතාර්ථ, හසලත්වය, හෙළ බස

(08) රූපක, පාමුල, කෘත්‍රිම, දිනුම යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දීර්ඝ ඇදය, ඇලපිල්ල, ගැට ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල

(2) දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, ගැට ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල

(3) දීර්ඝ පාපිල්ල, ඇදය, ගැට ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල

(4) දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, ගැට ඇලපිල්ල

(09) ''ජය'' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,

(1) කණ්ඨජ ය (2) තාලුජ ය (3) ඕෂ්ඨජ ය. (4) මූර්ධජ ය

(10) අකාරාදී පද පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.

(1) සුනේත්‍රා, විජයබා කොල්ලය, සක්වා ලිහිණි, සදා මෙලෙස පුර දෙරණේ

(2) නෙලුම්, තඹර, පංකජ, කමල්

(3) යහළු, සකි, සගය, සබඳ

(4) අන්නාසි, කෙසෙල්, දොඩම්, ජම්බු

(11) අනුක්ත නාම පද **පමණක්** යෙදී ඇති වරණය තෝරන්න.

(1) ශිෂ්‍යයකු, තොපි, දෙවඟනක්, ඔවුන් (2) වෙළෙන්දෝ, මගීහු, සතුන්, කුරුල්ලන්

(3) හෙදියක, ගෙවිලියන්, මිතුරන්, වියත්තු (4) මව්පියන්, සංචාරකයන්, නීතිවේදියකු, ලේඛකයන්

(12) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) මිශ්‍ර ක්‍රියා - පනිමින්, රකිමින්, සිනා සී, වඩිමින්

(2) උපසර්ග - පර, දු, අභි, අති

(3) යුගල පද - දඩ මුඩ, කවා පොවා, යාම් ඊම්, උයන පිහන

(4) නිපාත - සමඟ, ඉතා, වෙත, වැනි

(13) අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1) බලන් කඩතුරා හැර දැසේ

(2) යසෝමා ඉස්තෝප්පුවට පැමිණ මහේන්ද්‍රට අඬ ගැසුවා ය.

(3) වැසි දියෙන් වැව පිරුණොත් ගොවීන් සතුටු වේවි

(4) මේ වන විට දිවයින පුරා ජාතික නිදහස් ව්‍යාපාරය පැතිරෙමින් තිබුණි.

(14) පොදු සිංහලයෙහි "පැපොල්" යන්න මොනරාගල ජනවහරෙහි හඳුන්වන්නේ,

(1) අඹ ය. (2) කොස් ය. (3) බඩ ඉරිඟු ය. (4) වට්ටක්කා ය.

(15) මහල්ලෝ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) මහල් + ඕ (2) මහල්ලා + ඕ (3) මහලු + ඕ (4) මහල්ල + ඕ

(16) පරිශීලනය, වාක් කෝෂය, චිරන්තන, කාව්‍යෝක්ති යන පදවල අරුත් නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

(1) ඇසුරු කිරීම, වචන සමූහය, කාව්‍යමය කියමන්, පෞරාණික

(2) වචන සමූහය, කාව්‍යමය කියමන්, ඇසුරු කිරීම, පෞරාණික

(3) පෞරාණික, වචන සමූහය, කාව්‍යමය කියමන්, ඇසුරු කිරීම

(4) ඇසුරු කිරීම, වචන සමූහය, පෞරාණික, කාව්‍යමය කියමන්

❖ **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(17) ලේඛකයාගේ **හසළත්වය** ඔහුගේ නිර්මාණ ඇසුරු කිරීමේ දී මැනවින් ප්‍රකට වේ.

(1) විශිෂ්ටත්වය (2) නිපුණත්වය (3) ආධුනිකත්වය (4) උද්‍යෝගීත්වය

(18) මළුව වටා කයියෝරුවක් හැටියට **හත්රීපාකාරයක්** පිහිටා ඇත.

(1) ඇත් පවුරක් (2) වේදිකාවක් (3) කළුගල් පවුරක් (4) වැලි මිදුලක්

(19) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා දේශීය නාට්‍ය කලාවක් ස්ථාපනය කිරීමේ **පුරෝගාමියා** වූයේ ය.

(1) උපදේශකයා (2) අතරමැදියා (3) සන්නිවේදකයා (4) පෙරගමන්කරු

❖ **දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.**

(20) (1) ස්තූපය, බෝධිඝරය, මළුව, පුප්ඵාධාන (2) භාෂණය, ලේඛනය, ශ්‍රවණය, ධාරණය

(3) ගයවයි, බොද්දී, බසින්න, නටන්නී (4) රංග විධාන, ප්‍රේක්ෂකයා, අභිනය, ජවනිකා

(21) එක් එක් පද පෙළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) මව - ජනනී, අධම - පහත්, ස්වාධීන - වහල්, රත්රන් - කසුන්

(2) සාගරය - දලනිඳු, විහඟ - කුරුලු, ශරීරය - ගත, සුළඟ - පවන

(3) මේඝය - අහස, ජවන - ධාවන, උදක - දිය, වල - වනාන්තරය

(4) ඇතා - වරණ, ශක්‍රයා - දෙවිඳු, තුරු - හිස, ශ්‍රමණ - භික්ෂු

(22) මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) දද - කුරුලු, අනුවණ, කුෂ්ඨ, කොඩි (2) වත - මුහුණ, වස්ත්‍රය, කථාව, සිරිත

(3) අහස - ගුවන, ගගන, නුබ, ආකාශය (4) කර - බෙල්ල, අත, රශ්මිය, දහනය

(23) **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) උත්කෘෂ්ට - නිකෘෂ්ට (2) සතුරු - පිළිමල් (3) උත්තර - උතුරු (4) මෝහය - දුක

(24) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) "ඤ" යන්න වර්ගාන්ත අක්ෂරයකි.

(2) "අනේ! යන්න භාවාර්ථය හඟවන නිපාතයකි.

(3) බළල්ලු යන්න ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට බළල්+ලු වේ.

(4) "ගයද්දී" යන්න කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.

(25) පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) කථනයේ දී මෙන් ම ලේඛනයේ දී ද අදහස් රසවත් ව හා සිත් ගන්නා පරිදි ඉදිරිපත් කිරීමට රුඩී හෙවත් ඉඟිවැකි උපකාරී වේ.

(2) ගොවිතැන උදෙසා පොහොර සහනාධාරය හේතුවෙයි.

(3) අතීතයේ සිදු වූ යම් යම් දේ විනා අප නොසලකා හැරිය යුතු ය.

(4) ඇතැම් දරුවන්ගේ වැරදි පිණිස දෙමාපියන් වගකිව යුතු නැත.

❖ **අංක 26, 27 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

(26) "ඕනෑවට එපාවට යමක් කිරීම"

(1) දී කිරට බළල්ලුත් සාක්කිලු (2) ලෙඩ කපුටා වැළ කන්නා සේ

(3) ගමරාල දිව්‍ය ලෝකෙ ගියා වගේ (4) ජරමර අස්සෙ බර කරත්ත

(27) "ජන්මයෙන් ලද දුර්ගුණ අත් නොහැරිය හැකි බව."

(1) උණ පුරුකෙ දැම්මත් බලු වලිගෙ ඇද නෑරේ (3) ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ

(3) බැඳ ගත්ත බෙරේ ගහන්න ඕනෑ (4) කණ කොකාගෙ සුද පේන්නෙ, ඉගිළෙන විටලු

(28) ග, ට අක්ෂර උත්පත්ති ස්ථානය අනුව පිළිවෙළින් දැක්වූ විට,

(1) මූර්ධජ හා කණ්ඨජ වේ. (2) කණ්ඨජ හා මූර්ධජ වේ.

(3) මූර්ධජ හා දන්තජ වේ. (4) කණ්ඨජ හා තාලුජ වේ.

❖ **අංක 29 සිට 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(29) (1) අයෙක් විභාගය සමත් විය. (2) කවරෙක් නිවසට ඇතුළු වී ද?

(3) ඇදුරාණෝ සිසු දරුවන් දිරිමත් කරති. (4) තරු පොකුර දිප්තිමත් ව බැබළෙති

(30) (1) මැණියන් දැ විහාරයට ගියා ය. (2) නෝනා කෙනෙක් සාරියක් මිල දී ගනිති.

(3) දියණියෝ මව්පිය උපදෙස් පිළිගත්තා ය. (4) හට පිරිස නිදහස් උලෙළට එක් වූ හ.

(31) - ඈ දරුවන් ................................. කැප වූ උදාර මාතාවක් වූවා ය.

- විවිධ රටවල් .............................. තොරතුරු සෙවීම ඔහුගේ විනෝදාංශය විය.

- අත්තම්මා ප්‍රතිකාර ලබා ගැනීම ............................. රෝහල කරා ගියා ය.

- ජලය ධනය ............................. සුරකින්න.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) වෙනුවෙන්, ගැන, සඳහා, මෙන් (2) සඳහා, ගැන, වෙනුවෙන්, මෙන්

(3) මෙන්, සඳහා, ගැන, වෙනුවෙන් (4) වෙනුවෙන්, මෙන්, ගැන, සඳහා

(32) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

"සමහර කෙනෙක් ඒක ගැන ඇහුවා."

(1) සමහර කෙනෙක් ඒ ගැන ඇසුවේ ය. (2) සමහර කෙනෙක් ඒ ගැන ඇසුවෝ ය.

(3) සමහර කෙනෙක් ඒ ගැන ඇසුවා ය. (4) සමහර කෙනෙක් ඒ ගැන අසන්නී ය.

(33) "මං තනන්නෝ" නම් කෙටිකතාවේ රචකයා වනුයේ,

(1) ජී.බී. සේනානායක ය. (2) ඇරැව්වල නන්දිමිත්‍ර ය.

(3) ගුණදාස අමරසේකර ය. (4) මහගමසේකර ය.

(34) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා ජනප්‍රිය වූයේ කවර ගෞරවාන්විත නාමයකින් ද?

(1) ජාතියේ පියා (2) නිදහස් අධ්‍යාපනයේ පියා

(3) කොස් මාමා (4) සියවසේ පියා

(35) සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම ආකස්මික ව කළ හැකි දෙයක් නොවේ. යන පාඨයෙහි "ආකස්මික ව" යන්නෙහි අර්ථය කුමක් ද?

(1) අරමුණක් නැති ව (2) අර්ථයක් නැති ව (3) හේතුවක් නැති ව (4) අධෛර්යවත් ව

(36) පහත සඳහන් කවියෙහි තුන්වැනි පදය තෝරන්න.

ඉහළ වෙලේ ඉස්මත්තේ
දිය හබරල මල් ගොල්ලේ
......................................................
බිමට නැමී කවුදෝ ඔය
පළා නෙළන්නේ

(1) නීල වරල ළමැද හෙළාලා (2) කෙකටිය මල් උඩ ඇදිලා
(3) උඹේ සිනා කිරි උතුරා (4) කෙකටිය මල් සුද තවරා

(37) සූරිය මල අහස් තලේ සිනා මවන
හිමිදිරියේ
අග නගරේ
මහ වීදියෙ....

ඉහත පද්‍ය ඛණ්ඩයේ රචකයා වනුයේ,

(1) මහගමසේකර ය. (2) සිරි ගුණසිංහ ය. (3) නන්දන වීරසිංහ ය. (4) පරාක්‍රම කොඩිතුවක්කු

(38) "කිරි අත්තා", "අත්තප්පා", "ආත්තා" යනුවෙන් හැඳින්වෙන පද කොළඹ පළාතේ හඳුන්වන්නේ,

(1) ආච්චි යනුවෙනි. (2) සීයා යනුවෙනි.
(3) ලොකු තාත්තා යනුවෙනි. (4) බාප්පා යනුවෙනි.

(39) "ගරු නම්බු" යන යුගල පදයෙහි පද යුගලය අර්ථයෙන් සමාන වේ. එවැනි යුගල පදයක් වන්නේ,

(1) උදවු පදවු ය. (2) අස් පස් ය. (3) ලේසි පාසු ය. (4) කන කර ය.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

"කාව්‍ය රස වින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුම ද වර්ධනය වන්නේ බස ඉතා සූක්ෂම ලෙස පරිහරණය කරන්නේ කවීන් වන නිසා ය."

(1) භාෂාව ඉතා සියුම් ලෙස භාවිත කරන්නේ කවීන් වන නිසා කාව්‍ය රස වින්දනයෙන් බස පිළිබඳ දැනුම ද වැඩෙයි.
(2) කවීන් නිතර භාෂාව භාවිත කරන නිසාත් කවි රස විඳීමෙන් බස පිළිබඳ දැනුම වඩාත් වර්ධනය වේ.
(3) කාව්‍ය රස වින්දනයේ යෙදෙන්නා නිතර සියුම් ව බස පරිහරණය කරන නිසා බස පිළිබඳ දැනුම ද වැඩේ.
(4) බස පිළිබඳ කවීන් තුළ ඇති විශිෂ්ට දැනුම හේතු කොට ගෙන කාව්‍ය රස වින්දනයෙන් බස පිළිබඳ දැනුම වැඩේ.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

නම/විභාග අංකය :- ........................................................

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

◆ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක් අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"අප රට තුල සිදු වූ සංස්කෘතික, සාමාජීය හා තාක්ෂණික දියුණුව ඉතා විශිෂ්ට විය."

(ii) සිංහල අක්ෂර මාලාවේ,

(අ) අඝෝෂ අක්ෂර දෙකක් ද

(ආ) අර්ධානුනාසික්‍ය අක්ෂර දෙකක් ද ලියන්න.

(iii) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද අයත් වන ක්‍රියාපද වර්ගය ලියන්න.

(අ) ගායකයන් සුභාවිත ගීත ගයන <u>කල්හි</u> ශ්‍රාවකයෝ සතුටු වෙති.

(ආ) ගුරුවරයා ශිෂ්‍යයා ලවා සභාව <u>මෙහෙයවයි.</u>

(iv) පහත සඳහන් උද්ධෘතවල ඇතුළත් නිපාත පද දෙකක් උපුටා ලියන්න.

(අ) "ළමයෙක් ඒ අසා - හැඬී බළලෙකු විලසා"

(ආ) "වැටී අයදිමි අහෝ සාමිනි."

(v) පහත සඳහන් ප්‍රකාශවලට සුදුසු තනි පද ලියන්න.

(අ) දුර දිග බලා කටයුතු කරන.

(ආ) අඩක් සාගරයෙන් ද ඉතිරිය ගොඩබිමින් ද වටවූ ප්‍රදේශය.

(vi) පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා යෙදෙන පොදු ව්‍යවහාරය ලියන්න.

(අ) ගහමප (ආ) ඔයනවා

(vii) පහත සඳහහන් අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(අ) වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම.

(ආ) අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම.

(viii) පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

(අ) ආකස්මිකව (ආ) අසනිපාතයක්

(ix) පහත සඳහන් වචනවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) නුවණ (ආ) නුවන

(x) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) සාමාජිකයෝ නිලධාරීන් සාදරයෙන් පිළිගනිති.

(ආ) තරුණයෝ පුරන් කුඹුරු අස්වැද්දූ හ. (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන (අ) , (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) විශ්වයේ ජීවය පවතින එක ම ග්‍රහලෝකය පෘථිවියයි. පෘථිවියේ බලවතා මිනිසා ය. කොතෙක් බලවත් වුව ද අනෙක් සියලු ම සතුන් මෙන් මිනිසාට ද ආශ්වාස කිරීමට අවශ්‍ය ප්‍රාණ වායුව ලැබෙන්නේ වෘක්ෂලතා පද්ධතියෙනි. එහෙත් වර්තමානය වන විට මිනිස් බලවතා පරිසරයට කරනු ලබන හානිය කෙතෙක් ද යත් අද පිරිසිදු වාතය දුර්ලභ දෙයක් බවට පත්ව ඇත. මහනුවර, කොළඹ පුරවර ඊට සාක්ෂි සපයයි. වන සංහාරය සිදු කරන අතර ඊට පිළිතුරක් ලෙස රුක් රෝපණ වැඩසටහන් දියත් කළ ද ඒවා නඩත්තු හා ආරක්ෂාව පිළිබඳ කිසිවෙකුගේ සැලකිල්ලක් නැත. රුක් රෝපණයෙන් හා ඒවා ආරක්ෂා කර ගැනීමෙන් සමස්ත ජීවීන්ට හිතකර පරිසරයක් ගොඩනගමු.

(ආ) අතීතයේ දී දුම්පානය කරන්නන් නිසා බස් රථයක හෝ බස් නැවතුමක මගී ජනතාවට රැඳී සිටීමේ අපහසුවක් තිබුණි. එහෙත් වර්තමානය වන විට එම තත්ත්වයෙන් මිදී සිටීමට ලැබීම භාග්‍යයකි. ඒ භාග්‍යය හමුවේ ඊට වඩා ප්‍රබල වූ අභාග්‍යයකට මුහුණ දීමට වර්තමාන සමාජයට සිදු වී ඇත්තේ දුම්බීමට වඩා ප්‍රබල වූ මත්ද්‍රව්‍ය වන මත්පෙති, මත්කුඩු හෂීස් හා ගංජා භාවිතයට පාසල් ළමා පරපුර ද තරුණ පරපුර ද ගොදුරු වී තිබීමයි. පාසල් අසල පවා නීති විරෝධී අන්දමට කරනු ලබන මත්ද්‍රව්‍ය ජාවාරම් පාසල, නිවස, සමස්ත සමාජයට ම ප්‍රබල බලපෑමක් කර තිබීම කනගාටුදායක තත්ත්වයකි. දුම්පානය සමාජයෙන් ප්‍රතික්ෂේප කළා මෙන් මත්ද්‍රව්‍ය භාවිතයට ගොදුරු වී ඇති තරුණ පරපුර ඉන් බේරා ගැනීමට සුදුසු පිළියම් යෙදීමට කාලය එළඹ ඇත.

(ඉ) මාර්ගයේ රථවාහන ධාවනයේ අවිධිමත් භාවය හා සංයමයකින් තොරවීම රිය අනතුරු බහුලවීමට බලපා ඇත. එක් දිනකට රිය අනතුරුවලින් මිය යන සංඛ්‍යාව දිනෙන් දින ම වැඩිවන බව ජන මාධ්‍ය අපට තොරතුරු සපයයි. විශේෂයෙන් ම රියදුරන් මත්ද්‍රව්‍ය භාවිතා කර, නිදි වරා දුරකථන භාවිත කරමින් රිය පැදවීම හා බාල වයස්කාර දරුවන් රියදුරු බලපත්‍ර රහිතව රිය පැදවීම මාර්ග අනතුරුවලට හේතුවන කරුණු කිහිපයකි. රථවාහන ධාවනයේ දී අනවශ්‍ය ලෙස නළාව නාද කරමින් සංයමයෙන් තොරව රිය පැදවීම බොහෝ විට දැකගත හැකිය. ශ්‍රී ලංකාව අධ්‍යාපන මට්ටමින් ඉහළ යයි පිළිගනු ලැබුවත් අපරීක්ෂාකාරී වීම අනතුරු බහුලවීමට හේතු වී ඇත. අනතුරුවලින් තොරව රිය ධාවනය කිරීම කවර තරාතිරමේ පුද්ගලයෙකුගේ වුවත් තම රට හා ජාතිය වෙනුවෙන් කරන යුතුකමක් හා වගකීමක් විය යුතු ය.

(ඊ) සාහිත්‍යය පොත පත මෙන් ම සෞන්දර්යාත්මක අවස්ථා අපගේ ජීවිත පිනවා මනස සතුටට පත් කරයි. තාක්ෂණික මෙවලම් අතර මනස සැරිසරවන නූතන පරපුර සාහිත්‍යය වින්දනයෙන් ඈත් වී ඇත. සාහිත්‍යය පරිශීලනය නොකරන්නා ගවයෙකු වැනි යැයි කියමනක් ද වේ. ජීවිතයේ කටුක නිරස බව තුරන් කිරීමේ ශක්‍යතාවයක් සාහිත්‍යය සතුව ඇත. ඒ බව නවකතා, කෙටි කතා, කවි, ගී, සිංදු, නාට්‍ය, චිත්‍ර ඇසුරු කරන්නෝ හොඳින් හඳුනති. සෞන්දර්ය නොහඳුනන පුද්ගලයාගේ මනස රොබෝ මිනිසෙකුගේ මනසට සමකළ හැකිය. 70, 80 දශකයේ ගී සිංදු අදත් අප මනස ප්‍රබෝධවත් කරයි. අප මනස සංයමයට හා සෞන්දර්යාත්මක බවට පත් කර ගැනීමට පොත්පත්, කවි, ගී, සිංදු, නාට්‍ය ඇසුරු කරමු.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 45 - 55 ත් අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන ගණන සාරාංශයේ අග ලියන්න.

"විජයවතරණයටත් පූර්වයෙහි, යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන කුවේණි රාජිනියගේ කාලයේ සිට රෙදි විවීමේ කර්මාන්තය විශේෂයෙන් කාන්තා පක්ෂයට ආවේණික වූ එක ම කර්මාන්තය බව අවිවාදයෙන් පිළිගෙන තිබේ. ලංකාවේ පැරණිතම මෙම රෙදි කර්මාන්තය විදේශිකයන්ගේ සංක්‍රමණයත් සමඟ පහත වැටුණ ද, එය නැවත නඟාලිවීමට අපේ කාන්තා පක්ෂය මෙන් ම පුරුෂ පක්ෂය ද ඊට සහයෝගය දිය යුතු ය. විශේෂයෙන් මේ සඳහා රජයේ ආධාර ලබා දීම ගැන හැම අතින් ම අප රජයට ස්තුතිවන්ත විය යුතු ය"යි වැලිගම ස්වෙච්ඡා සේවක තරුණ සංගමය විසින් රජයේ ද ආධාරය ඇති ව රුපියල් 8000 ක් පමණ වැය කොට, වැලිගම හෙට්ටි වීදියේ අභිනවයෙන් ඉදි කරනු ලැබූ පෙහෙකම් විදුහල විවෘත කිරීම නිමිත්තෙන් එම විද්‍යාපීඨයේ පැවැත් වූ ප්‍රසිද්ධ මහා උත්සව සභාවේ මුලසුන දරූ එම සංගමයේ අධ්‍යක්ෂ පණ්ඩිත ඩබ්ලිව්. වජිරරංසි හිමියෝ පැවසූ හ.

(ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ලොක්යේ බිහි වූ සැම සුභග ගණිතඥයන්ට, විද්‍යාඥයන්ට මෙන් ම දර්ශනවාදීන්ට ද භාෂාව තරම් ප්‍රයෝජනවත් වූවක් තවත් නැත. තමාගේ සිතුවිලි පැවැත්ම ඇති වීමට, අවබෝධය ලබා ගැනීමට, තමා අවබෝධ කරගත් දේ ප්‍රකාශ කිරීමට ප්‍රධානතම මාධ්‍යය වන්නේ භාෂාවයි. අයින්ස්ටයින් තමාගේ දැනීම සොයා ගත්තේ භාෂාව මගිනි. එම දැනුම පැතිරවීමට යොදා ගත්තේ ද භාෂාවයි. යම් කිසිවෙකු භාෂාවකට විශිෂ්ට දක්ෂතාවක් දක්වතොත් එය බුද්ධිමත් භාවයේ ලකුණක් හැටියට මනෝවිද්‍යාඥයෝ පිළිගනිති. බුද්ධිමත් භාවය මැනීමට යොදා ගන්නා සාධකය භාෂාවයි. එම පිළිගැනීම අනුව යම් කිසිවෙකු විද්‍යා අංශයට හෝ වෛද්‍ය අංශයට හෝ තෝරා ගැනෙන්නේ ඔහු භාෂාව පිළිබඳ දක්වන දක්ෂතා අනුව ය. බුද්ධි පරීක්ෂණයක ප්‍රධාන අංගය භාෂාව සම්බන්ධිත ප්‍රශ්න වනුයේ ඒ නිසා ය. සාධක විග්‍රහ කිරීමේ විද්‍යානුකූල ක්‍රමය අනුව භාෂාවක දක්ෂතාව උසස් බුද්ධියක ලක්ෂණ බැව් විද්‍යාත්මක ලෙස මනෝ විද්‍යාඥයෝ පෙන්වා දෙති. භාෂාවට දක්ෂ දරුවා ගණිතයට ද දක්ෂයෙක් වෙයි. විද්‍යාවට දක්ෂ පුද්ගලයා භාෂාවට ඉතා දක්ෂයෙක් විය යුතුම ය. විද්‍යාඥයා භාෂාව පිළිබඳ දක්ෂතා පෙන්වීමට සාහිත්‍යය කෘති නොලියයි. එහෙත් අදහස් පැහැදිලිව අවබෝධ කර ගැනීමටත් තමා සකසා ගත් සංකීර්ණ වූත්, ඉතා ගැටලු සහිත වූත් න්‍යායක් ඉදිරිපත් කිරීමටත්, ඔහුට ආධාර වන්නේ භාෂාවයි. භාෂා වර්ධනය මානසික වර්ධනයෙහි ලක්ෂණ බැව් පියාජේ පෙන්වා දෙයි.

(i) මිනිසාට භාෂාවෙන් වන සේවයන් දෙකක් ලියන්න.

(ii) භාෂාව පිළිබඳව මනෝවිද්‍යාඥයන්ගේ අදහස කුමක් ද?

(iii) බුද්ධි පරීක්ෂණයක ප්‍රධාන අංගය වන්නේ කුමක් ද?

(iv) ඡේදයේ සඳහන් ලෝක ප්‍රකට පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(v) පහත සඳහන් වචනවල තේරුම ලියන්න.

(i) සුභග (ii) සංකීර්ණ

(ලකුණු 2 × 5 = 10)

(05) මුල්කිරියාගම "සඳගිරිතැන්න" මහා විද්‍යාලයේ ගෘහ විද්‍යා විෂය හදාරන දරුවන් සඳහා ගෘහ විද්‍යාගාර පහසුකම් නැත. පාසල් සංවර්ධන සමිතියේ හා ආදි ශිෂ්‍ය සංගමයේ අනුග්‍රාහකත්වයෙන් ගෘහ විද්‍යා විෂය හැදෑරීමට සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කර ඇත. එම ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය 2020.05.28 වන දින පෙරවරු 09.05 ට යෙදෙන සුබ මොහොතින් මුල්කිරියාගම අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දිනිති කිතුලම්පිටිය මහත්මිය අතින් විවෘත කිරීමට නියමිතය. මෙම තොරතුරු ඇතුළත් කරමින් ආරාධිතයන් සඳහා යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. ඔබ සඳගිරිතැන්න විද්‍යාලයේ ගෘහ විද්‍යා සංගමයේ ලේකම් කාවිංග ජයමාල් යැයි සිතන්න.

නැතහොත්,

දෙවුන්දර සඳපානාගම අරුණෝදය විද්‍යාලයේ 2020 වර්ෂයේ දෙවැනි වාරයේ වාර්ෂික චාරිකාව යාම සඳහා අදහස් කර ඇත. ඒ සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයෙන් අවසරය ලබා ගත යුතු ය. එම චාරිකාව යාමට අදහස් කරන දින ගණන, යාමට නියමිත දිනය, නැරඹීමට අපේක්ෂා කරන ස්ථානය, ගමනට සහභාගී වන ශිෂ්‍ය සංඛ්‍යාව, ගුරු භවතුන් සංඛ්‍යාව, බස් රථ ගණන, සියලුම දෙනා සඳහා රක්ෂණය ලබා ගැනීමට අපේක්ෂිත බව යන සියලු කරුණු ඇතුළත් කරමින් දෙවුන්දර අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් අවසරය ලබා ගැනීම සඳහා යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. (ඔබ සඳපානාගම අරුණෝදය විද්‍යාලයේ සමාජ විද්‍යා සංගමයේ ලේකම් අංජන බාලසූරිය යැයි සිතන්න.)

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

**නම/විභාග අංකය :- ......................................................... කාලය: පැය 02 යි.**

සැලකිය යුතුයි:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

- (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) (අ) පන්සියය පනස් ජාතක කථා පොත ලියූ යුගයේ රජ කළ රජතුමා කවු ද?
(ආ) ජාතක කතා පොතට මුල් වූ කෘතිය නම් කරන්න.

(ii) (අ) ගුත්තිල කාව්‍යයට මුල් වූ ජාතක කතාව නම් කරන්න.
(ආ) එම කාව්‍යය රචනා කිරීමට ආරාධනා කළේ කවුද?

(iii) උම්මග්ග ජාතක කථාවෙහි සඳහන් පරිදි රජවරුන්ගේ පාලන ප්‍රදේශ ලියන්න.
(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා
(ආ) වේදේහ රජතුමා

(iv) (අ) වෑත්තෑවේ හිමියන්ගේ ගුරු හිමියන් කවුද?
(ආ) ගුරු හිමියන් තම අතවැසියා අමතා දුන් උපදෙස කුමක් ද?

(v) (අ) ගුත්තිල කාව්‍යය රචනා කළ සාහිත්‍ය යුගය නම් කරන්න.
(ආ) එම සාහිත්‍ය යුගයේ රජ කළ රජතුමා කවුද?

(vi) "මේ පණ්ඩිතයෝ මට මිණි රුවනක් ගෙනා වන්නාහ'යි සිතා
(අ) මිණි රුවන හඳුන්වන සුවිශේෂී නම කුමක් ද?
(ආ) "මේ පණ්ඩිතයෝ" යනුවෙන් අදහස් කරන තැනැත්තා කවු ද?

(vii) (අ) සතර කන් මන්ත්‍රණය සිදුවූයේ කවුරුන් අතර ද?
(ආ) ජාතක කතා පොත රචනා කිරීමට අනුග්‍රහය දැක්වූ අමාත්‍යවරයා කවු ද?

(viii) (අ) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය ගණන කීය ද?
(ආ) ගුත්තිල කාව්‍යය ආරම්භ කර ඇති කාව්‍ය ගණය හඳුන්වන්න.

(ix) (අ) මහෞෂධ පණ්ඩිත තුමාට ධර්ම යුද්ධයට යෑම සඳහා නොයෙක් රසයෙන් යුත් භෝජන පිළියෙල කළේ කවු ද?
(ආ) බ්‍රහ්මදත්ත රජතුමාට එකොළොස් වැනිව හිඳ අනුශාසනා කරන්නේ කවරහු ද?

(x) "මහරජ නොසිතා වදාළ මැනව මගේ බලවත් උපායක් ඇති."
(අ) මෙසේ පැවසුවේ කවු ද?
(ආ) බලවත් උපාය කුමක් ද? (ලකුණු 2 x 10 = 20යි)

(02) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "සියලු තමන් දුටු දෙයත් ඇසූ දෙයත් පණ්ඩිතයනට දැන්වූහ. උන්වහන්සේ විසින් රජ්ජුරුවෝ ගිවිස්සෝ දැයි විචාළ කල්හි ගිවිස්නා ලද යැ දේවයෙනි"යි කීහ.

(අ) මෙහි ගිවිස්නා ලද්දේ කුමක් ද?

(ආ) උන් වහන්සේ හා රජ්ජුරුවෝ යනුවෙන් මෙහි අදහස් කරන්නේ කවුරුන් දැ'යි පිළිවෙළින් ලියන්න.

(ii) "සැට යොදුන් රග්ගල් තලා මස්තකයෙහි නාද කරන ලද සිංහ රාජයෙකු මෙන් නොබව මැනව දේවයන් වහන්ස, රාජ්‍ය සුව අනුභව කළ මැනව"

(අ) මෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) රජතුමා බිය වී ඇති කාරණය කුමක් ද?

(iii) වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
පුරඹර වසමින් සිටි රඟකුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) සමස්ත පද්‍යයේ අදහස ලිහිල් බසින් ලියන්න.

(iv) දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
......................................................................
......................................................................

(අ) අවසන් පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

(ආ) සව් සත සතන් තුටු කොට යන පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

(v) "තෝ දියෙන් යන්නෙහි මූට කුමක් කී දැ"යි විචාරා "මෙලෙස කිමි" කී කල්හි "එසේ වී නම් තට රුවියක් හැර ගෙන යව"යි කීහ.

(අ) ඉහත උද්ධෘතය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) මෙහි සඳහන් "රුවි" සහ "විචාරා" යන පදවල අර්ථය දක්වන්න. (ලකුණු 04×05 =20යි)

(03) (i) (අ) සතුන් මෙන් ම

(ආ) මිනිසුන් ද

ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනයෙන් වශීකෘත වී ඇති අන්දම උදාහරණ දෙක බැගින් ගෙන විමසන්න.

නැතහොත්

(ii) (අ) ආත්මාර්ථකාමී, බල තණ්හාව කේවට්ට චරිතයෙනුත්

(ආ) පරාර්ථකාමී බව හා දයානුකම්පාව මහෞෂධ චරිතයෙනුත් පෙන්නුම් කරයි.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන සනාථ කරන්න. (ලකුණු 15යි)

(04) (i) (අ) උපමා භාවිතයත්

(ආ) හාස්‍ය රසයත් නිසා නිර්දේශිත සතර කන් මන්ත්‍රණය පාඩම රසවත් වී ඇත.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න.

නැතහොත්

(ii) ගුත්තිල කාව්‍ය විශිෂ්ට නිර්මාණයක් වී ඇත්තේ,

(අ) සරල වහර ද

(ආ) වියත් වහර ද

වෑත්තෑවේ හිමියන් භාවිත කළ හෙයිනි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසන්න.

(ලකුණු 15යි)

**5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

(05) උම්මග්ග ජාතකයෙහි මහෞෂධ පඬිතුමා තමා සේවය කරන රාජ්‍යයටත්, රටවැසියාටත් අවංකව වැඩ කරන රාජ්‍ය සේවකයෙකි. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්** ගෙන විමසන්න. (ලකුණු 10යි)

(06) උපමා භාවිත කරමින් අර්ථ රසයෙන් යුත් අපූර්ව කාව්‍යයක් නිර්මාණය කිරීම වෑත්තෑවේ හිමියන් සතු දක්‍ෂතාවයකි. උදාහරණ **තුනක්** නිර්දිෂ්ට කොටසින් ගෙන සනාථ කරන්න. (ලකුණු 10යි)

(07) දුර දිග නොබලා වචන විනාශකාරී ලෙස පාවිච්චි කිරීම නිසා සමාජයට හානි සිදුවිය හැකිය. උම්මග්ග ජාතකයෙහි නිර්දිෂ්ට කොටසින් උදාහරණ ගෙන විමසන්න. (ලකුණු 10යි)